**විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය**

**දැනට රාජ්‍ය සේවයේ නියුක්ත සංවර්ධන නිලධාරි සේවයේ සහ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් අනුයුක්ත කර ගැනීම.**

විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයෙහි පුරප්පාඩු වී පවතින පහත දක්වා ඇති තනතුරු සඳහා රාජ්‍ය සේවයේ නියුක්ත සංවර්ධන නිලධාරි සේවය සහ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය යටතේ පත්වීම් ලබා ඇති නිලධාරීන්ගෙන් එකඟතාවය කැඳවීමට තීරණය කර ඇත.

01. පුරප්පාඩු සංඛ්‍යාව

| | | |
|---|---|---|
| 1. | පරිපාලන නිලධාරි | - තනතුරු 01 |
| 2. | සංවර්ධන නිලධාරී සේවය | - තනතුරු 04 |
| 3. | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | - තනතුරු 04 |

02. ඒ අනුව මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන, ඉ - රාජ්‍ය සහ සංවර්ධනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂය ක්ෂේත්‍රයන් යටතේ සම්බන්ධ වීමට කැමති, තොරතුරු තාක්ෂණය පිළිබඳ මනා දැනුමක් හා පළපුරුද්දක් සහිත නිලධාරීන් තම එකඟතාවය දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මඟින් 2017 මාර්තු 31 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයන්ට ලබා දෙන ලෙස කාරුණිකව දන්වමි.

**ලිපිනය :**

ලේකම්,
විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය,
නො.79/1, 5 වන පටුමග,
කොළඹ 03

**විද්‍යුත් ලිපිනය :** info@mtdi.gov.lk

03. එසේ අනුයුක්ත වීමට කැමති නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගනු ලබන අතර, එම නිලධාරීන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් මඟින් විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයට ස්ථාන මාරු කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

04. මේ පිළිබඳ වැඩි විස්තර විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ සහකාර ලේකම්, දුරකථන අංකය : 0112 301081 ඇමතීමෙන් ලබා ගත හැකි බව කාරුණිකව දන්වමි.

ලේකම්
විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය

2017.03.